# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1975/40 - 2016 ජූලි මස 12 වැනි අඟහරුවාදා - 2016.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත

14 වැනි වගන්තිය යටතේ නියෝගය

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය, මලික් සමරවික්‍රම වන මම, මුදල් අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2015 දෙසැම්බර් මස 11 වැනි දිනැති අංක 1944/54 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයෙහි උපලේඛනයේ සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය 14.04 යටතේ නිශ්චිතව සඳහන් කර ඇති භාණ්ඩවලට අනුරූපව මෙහි උපලේඛනයෙහි IV වැනි තීරුවේ දක්වා ඇති අනුප්‍රමාණය පරිදි 2016.07.13 වැනි දින සිට බලපැවැත්වෙන ලෙස සෙස් බද්ද සංශෝධනය කරනු ලබන බව ප්‍රකාශ කරමි.

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2016 ජූලි මස 12 වැනි දින,
කොළඹ 01,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය I | සංයෝජිත වර්ගීකරණ සංකේතය II | | විස්තරය III | සෙස් බදු ප්‍රමාණය IV |
|---|---|---|---|---|
| 14.04 | | | අන්තැනක නිශ්චිතව සඳහන් කොට හෝ ඇතුළත් කොට නොමැති වූ ශාකමය නිෂ්පාදන | |
| | | | | |
| | 1404.90 | - | අනෙකුත් : | |
| | 1404.90.10 | --- | බීඩි කොළ | කි. ග්‍රෑමයට රු. 2000/- |

07 - 1075